ආර්ථික විද්‍යාව I
Economics I

Two hours
පැය දෙකයි.

## අ.පො.ස (උසස් පෙළ) විභාගය,අගෝස්තු

## G.C.E. (Adv.Level) Examination, 2021 August

21 S I

No - 01

Econ අපි සමිත් අල්විස්
The ideal class for your eminent university dream

**1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට I,II,III,IV,V යන පිළිතුරු වලින් නිවැරදි වරණය හෝ ඉතාමත් ගැළපෙන වරණය තෝරන්න.**

**1) භෞතික අවශ්‍යතාවයට උදාහරණයක් වන්නේ,**

I. පාන්
II. ඇඳුම්
III. ආදරය
IV. කරුණාව
V. ආධ්‍යාත්මික සංවර්ධනය

**2) ආර්ථික විද්‍යාව ඉගැනුමේ වැදගත්කමක් නොවනුයේ,**

I. රාජ්‍ය පාලනයේදී වැදගත් නොවීම
II. සාර්ථක පුරවැසියෙකු ලෙස ජීවත් වීමට වැදගත් වීම
III. සාර්ථක රැකියාවක් තෝරා ගැනීමට වැදගත් වීම
IV. පාසැල් ශිෂ්‍යයන්ට වැදගත් වීම
V. අල්ලස මත්ද්‍රව්‍ය වැනි ප්‍රශ්න විසදීමට වැදගත් වීම

***3) හිගකම, උද්ධමනය, ආයෝජන, තේරීම, අපනයනය, ආන්තික පිරිවැය***
**ඉහත සදහන් දෑ අතුරින් සූක්ෂ්ම ආර්ථික විද්‍යාවට පමණක් අයත් සංකල්ප වනුයේ,**

I. හිගකම /උද්ධමනය/ ආයෝජන
II. තේරීම/ අපනයනය /ආන්තික පිරිවැය
III. ආයෝජන /තේරීම/ අපනයනය
IV. හිගකම/ තේරීම/ ආන්තික පිරිවැය
V. උද්ධමනය/ ආයෝජන /අපනයනය

**4) ප්‍රකාශයක නිරවද්‍යතාවය පහසුවෙන් පරීක්ෂාවකට ලක් කර හැකි ප්‍රකාශයක් වනුයේ,**

I. ශ්‍රී ලංකාවේ සංවර්ධනයට විදේශ ආධාර ලබා ගත යුතුය
II. රාජ්‍ය සේවකයෙකුගේ මාසික අවම වැටුප රු.10000 ක් විය යුතුය
III. ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන අනුපාතිකය 1% කි
IV. ආදායම් බෙදීයාමේ විෂමතාවය අසාධාරණ වේ
V. සෑම පුරවැසියෙකුටම නොමිලේ වෛද්‍යාධාර ලබා දිය යුතුය

Samith Alwis 0717556342

**5) අජීවී භාණ්ඩයකට උදාහරණයක් නොවනුයේ ,**

I. මිනිරන්
II. වනාන්තර
III. ගල් අඟුරු
IV. යපස්
V. ගෑස්

***6) පෑන්, පොත්, පැන්සල්***

**ඉහත සඳහන් දෑ අයත් වනුයේ,**

I. භාණ්ඩ මුදල් වලට ය
II. නොමිල භාණ්ඩ වලට ය
III. ශුභ සාධන භාණ්ඩ වලට ය
IV. ආර්ථික භාණ්ඩ වලට ය
V. පිරිවැය රහිත භාණ්ඩ වලට ය

**7) භූමියට අයත් ලක්ෂණයක් නොවන්නේ,**

I. සැපයුම අනම්‍ය වීම
II. ස්වභාව ධර්මයේ දායාදයක් වීම
III. සංචලතාවයෙන් යුක්ත නොවීම
IV. ඵලදායීතාවය වර්ධනය කළ හැකි වීම
V. ඒකාකාරී වීම

**8) ශ්‍රම ඵලදායීතාවය තීරණය කරන සාධකයක් නොවනුයේ,**

I. ස්වාභාවික ප්‍රාග්ධනය
II. සමාජ ප්‍රාග්ධනය
III. තාක්ෂණය
IV. සානුබල
V. මුදල්

**9) මූර්ත පිරිවැය ලෙස සළකනුයේ,**

I. ආවස්ථික පිරිවැය වේ
II. හිගකම වේ
III. ස්ථාවර පිරිවැය වේ
IV. විචල්‍ය පිරිවැය වේ
V. ආන්තික පිරිවැය වේ

**10) නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය ලෙස සළකනුයේ ,**

I. කුමක් නිපදවන්නේද යන්න වේ
II. කෙසේ නිපදවන්නේද යන්න වේ
III. කා සඳහා නිපදවන්නේද යන්න වේ
IV. කොපමණ නිපදවන්නේද යන්න වේ
V. හිගකම වේ

Samith Alwis 0717556342

**11) ආර්ථික පද්ධතියක ඇති වැදගත්ම ආයතනික ලක්ෂණයක් වන්නේ,**

I. රජය වේ
II. ව්‍යාපාර අංශය වේ
III. විදේශ අංශය වේ
IV. කුටුම්භ වේ
V. ඉහත සියල්ලම වේ

**12) සමාජවාදී ආර්ථික පද්ධතියක ලක්ෂණයක් නොවනුයේ,**

I. සියලුම නිෂ්පාදන සාධක රජය සතු වේ
II. සැළසුම් යාන්ත්‍රණය ක්‍රියාත්මක වේ
III. සමාජ සුභ සාධනය මත පදනම් වේ
IV. රජයේ කාර්යභාරය අසීමිත වීම
V. ඉහත සියල්ලම වේ

**13) නිෂ්පාදන සම්පත් රජය සතු, සම්පත් භාවිතය පිළිබඳ තීරණ ගැනීම පුද්ගලික අංශය සතු ආර්ථිකයකට උදාහරණයක් වනුයේ,**

I. හංගේරියාව
II. නෝර්වේ
III. ස්වීඩනය
IV. ජර්මනිය
V. පින්ලන්තය

**14) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් නිර්මාණයේදී සැළකිල්ලට ගන්නා උපකල්පනයක් නොවන්නේ,**

I. භාණ්ඩ වර්ග 2 ක් පමණක් නිපදවීම
II. ආර්ථිකය සතු සම්පත් සම්භාරය ස්ථාවර වීම
III. සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව අවශ්‍ය වීම
IV. තාක්ෂණය නොවෙනස්ව පැවතීම
V. සම්පත් පූර්ණව හා උපරිම කාර්යක්ෂමතාවයෙන් යුක්තව උපයෝජනය කිරීම

**15) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක අනුක්‍රමණය මගින් පෙන්නුම් කරනුයේ,**


I. ස්ථාවර පිරිවැය
II. ආවස්ථික පිරිවැය
III. විචල්‍ය පිරිවැය
IV. ආන්තික ආවස්ථික පිරිවැය
V. වැඩෙන ආවස්ථික පිරිවැය

**16) සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාවය සඳහා ඉටුවිය යුතු කොන්දේසියක් වනුයේ,**

I. MC=MB
II. MC=AC
III. AP=P
IV. MC=MB=P
V. ඉහත සියල්ල නිවැරදි වේ


Samith Alwis 0717556342

**17) පහත රූප සටහනේ B-C භාණ්ඩ සංයෝගයෙහි Y නිපදවීමේ ආවස්ථික පිරිවැය වනුයේ,**




I. -1
II. -1.5
III. -0.5
IV. -2
V. -0.6

**18)**




**ඉහත රූප සටහනේ A ලක්ෂයෙන් පෙන්නුම් කරනුයේ,**

I. හිගකම වේ
II. ආවස්ථික පිරිවැය වේ
III. තේරීම වේ
IV. නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව වේ
V. ආර්ථික කාර්යක්ෂමතාව වේ

**19) පෞද්ගලික ඉල්ලුම තීරණය කරන සාධකයක් නොවන්නේ,**

I. සළකා බලන භාණ්ඩයේ මිල
II. සම්බන්ධිත භාණ්ඩයන්ගේ මිල
III. පාරිභෝගික රුචිය
IV. තාක්ෂණය
V. පාරිභෝගික ආදායම

**20)** **ඉල්ලුම් නීතිය ඉදිරිපත් කිරීමේදී සැළකිල්ලට නොගන්නා උපකල්පනයක් වනුයේ,**

I. ඕනෑම අවස්ථාවක මිල හා ඉල්ලුම් ප්‍රමාණය සැළකිල්ලට ගැනීම
II. තාර්කික ගැනුම්කරුවෙකු වීම
III. සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම සැළකිල්ලට ගැනීම
IV. මිල හැර අනෙකුත් සාධක ස්ථාවරව පැවතීම
V. ඉහත කිසිවක් නොවේ

**21)** Qd = f ( P, Pn, Y, T, Ex, N, O)


**ඉහත දැක්වෙනුයේ ,**

I. ඉල්ලුම් සමීකරණයකි
II. ඉල්ලුම් ශ්‍රිතයකි
III. ඉල්ලුම් ලේඛණයකි
IV. සැපයුම් සමීකරණයකි
V. සැපයුම් ශ්‍රිතයකි

**22)** **සාමාන්‍ය භාණ්ඩයක මිල වෙනස්වීම නිසා ඇතිවන ප්‍රතිවිපාකය නිවැරදිව දක්වා ඇත්තේ,**

| මිල වෙනස්වීම | ආදේශන ප්‍රතිවිපාකය | ආදායම් ප්‍රතිවිපාකය | මිල ප්‍රතිවිපාකය |
|---|---|---|---|
| I. මිල වැඩිවීම | - | + | + |
| II. මිල අඩුවීම | + | - | + |
| III. මිල වැඩිවීම | + | + | - |
| IV. මිල වැඩිවීම | - | - | + |
| V. මිල අඩුවීම | - | + | - |

**23)**





**ඉහත රූප සටහනෙහි A-C දක්වා වෙනස්වීමට හේතුවක් වනුයේ,**

I. සළකා බලන භාණ්ඩයේ මිළ ඉහළ යාම
II. පාරිභෝගික රුචිය වැඩිවීම
III. තාක්ෂණය ඉහළ යාම
IV. පාරිභෝගික ආදායම වැඩිවීම
V. සළකා බලන භාණ්ඩයේ මිළ පහළ යාම

Samith Alwis 0717556342

**24)** පහත රූප සටහනෙහි ඉල්ලුම් රේඛාව ප්‍රමාණ අක්ෂය ස්පර්ශ කරන අවස්ථාවේ ඉල්ලුම් නම්‍යතාවයේ අගයක් විය හැකි වනුයේ,




I. -1
II. -1.5
III. -0.5
IV. 0
V. -0.5

**25)** සැපයුම් රේඛාව වමට විතැන්වීමට හේතුවක් නොවනුයේ,

I. සලකා බලන භාණ්ඩයේ මිල අඩුවීම
II. තාක්ෂණය යල් පැනීම
III. අනාගතයේ සලකා බලන භාණ්ඩයේ මිල වැඩි වෙතැයි අපේක්ෂා කිරීම
IV. සම්බන්ධිත භාණ්ඩයන්ගේ මිල වැඩිවීම
V. නිෂ්පාදන සහනාධාරය අහිමි වීම

**26)** කිසියම් භාණ්ඩයක මිල 5 දී සැපයුම් ප්‍රමාණය මිල මෙන් 20 ගුණයකි.එම මිලේදී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 300 කි.එම භාණ්ඩයට ඇති සැපයුම් නම්‍යතාවය 4 ක් වේ.භාණ්ඩයේ බෑවුම වනුයේ,

I. 60
II. 3
III. 20
IV. 80
V. 100

**27)** ව්‍යුත්පන්න ඉල්ලුමක් පවතිනුයේ,


I. ශ්‍රමය සඳහා වේ
II. ප්‍රාග්ධනය සඳහා වේ
III. භූමිය සඳහා වේ
IV. මානව ප්‍රාග්ධනය සඳහා වේ
V. ඉහත සියල්ල සඳහා වේ

Sanith Alwis 0717553342

**28)** භාණ්ඩයක ඉල්ලුම් සමීකරණය **Qd=50-5P**,සැපයුම් සමීකරණය **Qs=-10+5P** ද වේ.භාණ්ඩයේ සමතුලිත මිල වනුයේ,

I. 6
II. 4
III. 2
IV. 1
V. 0

**29)**




ඉහත රූප සටහන අනුව බද්දට පසු ආර්ථික අතිරික්තය වනුයේ,

I. 306.25
II. 800
III. 400
IV. 93.75
V. 612.50

**30)** භාණ්ඩයක මිල රු.10 දී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 60 ක් වන අතර සැපයුම් ප්‍රමාණය ඒකක 20 කි.භාණ්ඩයේ මිල රු.20 දී සැපයුම් ප්‍රමාණය ඒකක 40 ක් වන අතර එහිදී අධි ඉල්ලුමක් හට නොගනී.මෙම භාණ්ඩය සඳහා රජය රු.5 ක ඒකක සහනාධාරයක් ලබා දෙන්නේ නම් සහනාධාරයෙන් පසු ආර්ථික අතිරික්තය වනුයේ ,

I. 106.25
II. 400
III. 800
IV. 612.25
V. 1012.50

**31)** **උපරිම මිලක් නියම කිරීම නිසා ඇතිවන ප්‍රතිවිපාකයක් නොවනුයේ,**

I. භාණ්ඩ හිගයක් ඇති වීම
II. කළුකඩ මිලක් ඇති වීම
III. සමාජ සුභ සාධනයට අහිතකර වීම
IV. නිෂ්පාදන ක්ෂේත්‍රයේ කරනු ලබන ආයෝජන වැඩි වීම
V. සමතුලිත මිලට වඩා ඉහල මිලකට භාණ්ඩ අලෙවි කිරීම

**32)** **කිසියම් භාණ්ඩයක ඉල්ලුම් සැපයුම් සමීකරණ පහත පරිදි වේ.**

Qd = 50-5P      Qs = -10+5P

**මෙම භාණ්ඩයට රජය මැදිහත් වී රු.8 ක සහතික මිලක් ලබා දුනිනම් සහතික මිලෙන් පසු නිෂ්පාදන අතිරික්තය වනුයේ,**

I. 10
II. 160
III. 90
IV. 180
V. 100

**33)** **කිසියම් භාණ්ඩයක ඉල්ලුම් සැපයුම් සමීකරණ පහත පරිදි වේ.**

Qd = 700-5P      Qs = -200+5P

**මෙම භාණ්ඩයට රජය මැදිහත් වී රු.120 ක අවම මිලක් නියම කර අතිරික්ත සැපයුම රජය විසින් මිලදී ගැනීමට තීරණය කරයි.අවම මිල නිසා ඇති වන සුභ සාධන ප්‍රතිවිපාකය වනුයේ,**

I. -250
II. -5250
III. -36000
IV. -45700
V. -31500

**34)** **කිසියම් භාණ්ඩයක ඉල්ලුම් සැපයුම් සමීකරණ පහත පරිදි වේ.**


Qd = 350-5P      Qs = -50+5P

**මෙම භාණ්ඩයට රජය මැදිහත් වී රු.30 ක උපරිම මිලක් නියම කරයි නම් එහිදී ඇති වන කළුකඩ මිල වනුයේ,**

I. 100
II. 75
III. 50
IV. 25
V. 10

Samith Alwis 0717556342

**35)**




**ඉහත රූප සටහනට අනුව නිෂ්පාදකයා $Q_2$ ප්‍රමාණයක් සැපයීමට තීරණය කළේ නම් ඔහුගේ විචල්‍ය පිරිවැය වනුයේ,**

I. FGHI
II. BDCE
III. FDBA
IV. DEFG
V. A

**36) හීනවන ආන්තික ඵලදා නීතියට අනුව කිසියම් අවස්ථාවකට පසු පහළ බැසීමට ලක් වනුයේ,**

I. ආන්තික ඵලදාව හා සාමාන්‍ය පිරිවැය වේ
II. ආන්තික පිරිවැය හා ස්ථාවර යෙදවුම් වේ
III. සාමාන්‍ය ඵලදාව වේ සාමාන්‍ය පිරිවැය වේ
IV. සාමාන්‍ය ස්ථාවර පිරිවැය හා ආන්තික පිරිවැය වේ
V. ආන්තික ඵලදාව හා සාමාන්‍ය ඵලදාව වේ

**37) වැඩිවන පරිමාණුකූල ඵල ඇතිවීමට හේතුවක් නොවනුයේ,**

I. නිෂ්පාදන සම්පත් වල අභාජ්‍යතාවය
II. සම්බන්ධීකරණ ගැටලු පැවතීම
III. යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමේ හැකියාව
IV. එක්වරක් පමණක් පිරිවැය දැරීම
V. ඉහත සියල්ල වේ

**38) නිවැරදි ප්‍රකාශයක් නොවන්නේ,**

I. ආවස්ථික පිරිවැය = ඍජු පිරිවැය + වක්‍ර පිරිවැය
II. ආවස්ථික පිරිවැය = මූල්‍ය පිරිවැය + වක්‍ර පිරිවැය
III. ගණකාධිකරණ ලාභ = මුළු අයභාරය - ඍජු පිරිවැය
IV. ආවස්ථික පිරිවැය = ගණකාධිකරණ පිරිවැය + ගම්‍ය පිරිවැය
V. ගණකාධිකරණ ලාභ = මුළු අයභාරය - ආරෝපිත පිරිවැය

**39)** **ස්ථාවර පිරිවැයට අදාළ සංරචකයක් වනුයේ,**

I. ක්‍රම ක්ෂය ගාස්තු
II. ප්‍රාග්ධන ලාභ
III. රක්ෂණ වාරික
IV. දේපොළ බදු
V. ඉහත සියල්ල


**40)** **ගෑස් හා වාණිජ බැංකු අයත් වන වෙළඳපල ව්‍යුහය වනුයේ**

I. ඒකාධිකාරී තරගය
II. කතිපයාධිකාරිය
III. පූර්ණ තරගය
IV. ඒකාධිකාරිය
V. අපූර්ණ තරගය

**41)** **එක්තරා ආයතනයක නිමවුම 0 දී මුළු පිරිවැය රු.20 කි.නිමවුම 12 දී මුළු ආදායම රු.240 කි.එම නිමවුමේදී ආර්ථික ලාභ ශුන්‍ය වේ නම් නිමවුම 0 දී ආර්ථික ලාභ/අලාභ කොපමණ වේද?**

I. 0
II. 20
III. 120
IV. 188
V. 256

**42)**




**මෙම ආයතනයේ සාමාන්‍ය ලාභය වනුයේ,**

I. රු.8
II. රු.72
III. රු.180
IV. රු.108
V. රු.100

**43)** **නිෂ්පාදන සාධකයක සැපයුම පූර්ණ නම්‍ය වූ විට එම සාධකයේ ඉපැයීම්,**

I. සම්පූර්ණයෙන්ම ආර්ථික බදුකුළිය වේ.
II. සම්පූර්ණයෙන්ම සංක්‍රාම වේ.
III. වැඩි කොටසක් ආර්ථික බදුකුළිය වේ.
IV. වැඩි කොටසක් සංක්‍රාම වේ.
V. ආර්ථික බදුකුළිය හා සංක්‍රාම සමාන වේ.

**44)** **නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ ඇතුළට විතැන් වීමක් මගින් පෙන්නුම් කරනුයේ,**

I. ආර්ථික වර්ධනයකි
II. ආර්ථික බිඳ වැටීමකි
III. උද්ධමනයකි
IV. අවධමනයකි
V. ආර්ථික පසුබැසීමකි

**45)** C = 200+0.9Yd   I = 80   G = 300   T = 120 (සියලු දත්ත රුපියල් වේ)

**පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම් මට්ටම 5000 ක් වේ නම් එම මට්ටම ලබා ගැනීමට ආයෝජන කොතරම් ප්‍රමාණයකින් වැඩි කර යුතුද?**

I. 100
II. 108
III. 48
IV. 28
V. 72

**46)**

| වැය කළ හැකි ආදායම | පරිභෝජන වියදම | ආයෝජන | රාජ්‍ය වියදම් |
|---|---|---|---|
| 0 | 250 | 370 | 420 |
| 1000 | 1050 | 370 | 420 |

T = 50+0.25Y

**මෙම ආර්ථිකයේ ආයෝජන සඳහා සම්පත් මූල්‍යනය කිරීම සිදු වන්නේ,**

I. 170+300
II. 115+255
III. 250+120
IV. 300+70
V. 145+125

Samith Alwis 0717756342

**47)** **කිසියම් වසර කිහිපයක් තුල රටක මිනිසුන්ගේ ජීවන තත්වය සඳහා වඩාත්ම අවශ්‍ය කරන ජාතික මිණුම් සංඛ්‍යාත වන්නේ,**

I. ජාතික ආදායම/ජනගහනය/ සිල්ලර මිල දර්ශකය
II. ජාතික ආදායම/වැඩකරන ජනතාව/ආයෝජන
III. ජාතික නිෂ්පාදිතය/ගෙවුම් ශේෂය/ සිල්ලර මිල දර්ශකය
IV. ජාතික ණය/ජාතික ආදායම/ ගෙවුම් ශේෂය
V. ජාතික නිෂ්පාදිතය/ඉතුරුම්/ජනගහනය

**48)** **උද්ධමනාත්මක පරතරයක් බිහිවීමට හේතු වන්නකි,**

I. රජයේ ආදායමට වඩා වියදම වැඩිවීම
II. පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටමේදී විදීම් ඉක්මවා ගිලිහීම් පැවතීම
III. පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම ඉක්මවා සමාහාර ඉල්ලුම පැවතීම
IV. සමතුලිත ජාතික ආදායම් මට්ටම ඉක්මවා පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම පැවතීම
V. පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම ඉක්මවා සමාහාර ජාතික ආදායම් මට්ටම පැවතීම

**49)** **කිසියම් රටක ජාතික ආදායම් හා එහි සංරචක කිහිපයක් පිළිබඳ තොරතුරු කිහිපයක් මෙසේය**

ජාතික ආදායම - 500

පෞද්ගලික පරිභෝජන වියදම - 200

ආයෝජන වියදම - 100

පොදු පරිභෝජන වියදම - 150

අපනයන - 125

**ආනයන මට්ටම කොපමණද?**

I. 25
II. 50
III. 75
IV. 125
V. 175

**50)** **කල්පිත ආර්ථිකයක් සඳහා ඔබට පහත සඳහන් දත්ත සපයා ඇත.**

| | | |
|---|---|---|
| පෞද්ගලික පරිභෝජන වියදම - 200 | ක්ෂය වීම් - 10 | ආනයන - 40 |
| | රජයේ මිලදී ගැනීම් - 50 | රජයේ සංක්‍රාම ගෙවීම් - 20 |
| පෞද්ගලික බදු - 50 | දළ දේශීය පෞද්ගලික ආයෝජන - 40 | තොග වෙනස්වීම් - 05 |
| අපනයන - 30 | | |

**මෙම ආර්ථිකයේ ක්ෂුද්‍ර ආයෝජන හා දේශීය ඉතුරුම් පිළිවෙලින් වනුයේ,**

I. 30 හා 30 වේ
II. 270 හා 280 වේ
III. -10 හා 10 වේ
IV. 80 හා 270 වේ
V. 30 හා 0 වේ

Samith Alwis 0717563342





The Ideal class for your eminent university dream

Econ අපි

සමිත් අල්විස්

Econ (Sp) - Kelaniya, HRM - OU

☎ 071-7556342

Samith Alwis